# පුරවැසියාට බලය පැවරෙන ව්‍යවස්ථාවක අවශ්‍යතාව

මහාචාර්ය නවරත්න බණ්ඩාර

**2015 ජනවාරි 08 වෙනිදා රටේ සිදුවූ දේශපාලන වෙනසේ ප්‍රමුඛ ජන අභිලාෂය වූ 78 ව්‍යවස්ථාව මගින් ස්ථාපිත විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම මුල්කොට ගනිමින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කොට සම්මත කරගැනීම සඳහා වන සංවාදය නැවත වරක් දේශපාලන කරළියට පැමිණ තිබේ. මෛත්‍රී-රනිල් හවුල් ආණ්ඩුව විසින් නව ව්‍යවස්ථාවක් සම්පාදනය අරභයා ක්‍රියාවට නැඟූ වැඩ පිළිවෙළ තුළ නව ව්‍යවස්ථාවක් සඳහා වන මූලික ලියැවිල්ලක් සකස් වෙමින් තිබීමත් ඊට එරෙහිව ජනවාරි 8 විප්ලවයේ පරාජිත පාර්ශ්වය "යුද ප්‍රකාශ කිරීමත්" ඊට ආසන්න හේතුවය. නව ව්‍යවස්ථාවක් සකස් කිරීම සඳහා ආණ්ඩුව විසින් පත් කොට ඇති කමිටුවේ සාමාජිකයෙකු වන දේශපාලන විද්‍යාව පිළිබඳ මහාචාර්ය නවරත්න බණ්ඩාර නව ව්‍යවස්ථාවක අවශ්‍යතාව අවධාරණය කරන්නේ මෙලෙසිනි.**



නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සෑදීමේ කටයුතු මේ වන විට සිදුවෙමින් පවතී. එහි ඇතැම් කොටස් මේ වන විටත් සකස් වී තිබේ. තවත් කොටස් සකස් කරමින් තිබේ. විධායක ජනාධිපති ක්‍රමය, බලය බෙදාහැරීම, මැතිවරණ ක්‍රමය, ඒකීයත්වය ආදී මතභේදයට තුඩු දිය හැකි කරුණු පිළිබඳ එකඟත්වයක් ඇති කරගැනීමට අගමැතිවරයාගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වන පක්ෂ නායක කමිටුවට බාරදී තිබේ. මේ අතර අලුත් ව්‍යවස්ථාවක් අවශ්‍ය නොවන බවට සාකච්ඡාවක්ද දේශපාලන ක්ෂේත්‍රයේ සිදුවෙමින් පවතී. පවතින ව්‍යවස්ථාවම සංශෝධනය කොට ගෙන ඉදිරියට යාම එහි අරමුණයි. විධායක ජනාධිපති ක්‍රමය, ඡන්ද ක්‍රමය ආදී වෙනස් කළ යුතු දේවල් පමණක් වෙනස් කිරීම ප්‍රමාණවත් බවද ඇතැමෙක් කියති.
වර්තමානයේ ක්‍රියාත්මකව පවතින ව්‍යවස්ථාව 1978 සම්මත කරගන්නා ලද්දකි. එදා එය සෑදීමට මුල් වූ අයට ඒ සඳහා පැවතියේ ජනතාවට තිබුණු අවශ්‍යතාව නොවේ. පාලකයන්ට තමන් ලබා ගත් බලය තවත් තහවුරු කරගෙන ලැබුණු බලය රැකගැනීමේ අවශ්‍යතාවයයි. එය තුළින් තමන්ට එදා අවශ්‍යව තිබූ කටයුතු ක්‍රියාවට නැගීම පහසු කරගැනීමයි.
එම ව්‍යවස්ථාව 1978 සැප්තැම්බර් 30 දින අනුමත කෙරුණි. ඒ වන විට විධායක ජනාධිපති ධුරය ස්ථාපිත කොට එහි පුද්ගලයකු දිවුරුම් දී තිබිණ. එය සිදුවූයේ 1978 පෙබරවාරි 4 වෙනිදාය. එතෙක් ක්‍රියාත්මක වූයේ 1972 ව්‍යවස්ථාවයි. ඒ අනුව විධායක ජනාධිපති ධූරය ඇති කරන්නේ 1972 ව්‍යවස්ථාව උපයෝගී කොට ගනිමිනි. 72 ව්‍යවස්ථාවේ බලය සංවිධානය කොට තිබූ ආකාරයට සහ ජනාධිපති ධූරයේ බලතල ව්‍යවස්ථාවේ ලියා තිබූ අන්දමට ව්‍යවස්ථා සංශෝධනයකින් බලය විධායක ජනාධිපති අතට ගැනීමට ජයවර්ධන මහතාට බෙහෙවින් පහසු විය. ඔහු කළේ "අගමැති විසින් ජනාධිපති පත් කෙරේ." යන වගන්තිය ඉවත් කිරීමය. පාර්ලිමේන්තුවට යෝජනාවක් ගෙනැවිත් ජනාධිපතිවරයා ධුරයෙන් ඉවත් කිරීමට අගමැතිට බලය පැවරුණු වගන්තියද ඉවත් කිරීමය. තවදුරටත් "අගමැතිගේ උපදෙස් පිට ක්‍රියා කිරීම අවශ්‍යය ය." වැනි ජනාධිපති බලයට පැවති බාධා ඉවත් කිරීම ද මගින් ඉබේම ජනාධිපති ධුරය ඉහළට එසවිණි. ඔහු පූර්ණ බලය ඇති විධායකයා බවට පත් කෙරිණ. මේ සියල්ල ලිවීමෙන් අනතුරුව "ඒ අවස්ථාව වන විට අගමැති ධුරයේ සිටින මන්ත්‍රීවරයා 1978 පෙබරවාරි 4 දින ජනාධිපති වශයෙන් පත්වේ." කියා සංශෝධනයක් ද එකතු කරන ලදී. මෙලෙස සිදුකෙරුණු සංශෝධනය කිසිම අවස්ථාවක ජනතා සංවාදයට ලක් වූයේ නැත. ව්‍යවස්ථා සංශෝධනය පෙර දින උදයේ හදිසි කෙටුම්පතක් ලෙස අධිකරණයේ මතය ලබා ගෙන එදිනම සවස සම්මත කරගෙන ඇති බව අප දැනගත්තේ ද පසුදා උදේ පත්තරවලිනි. ජනතාව නිදා සිටි රාත්‍රියක පැය හයකට අඩු කාලයකදී එලෙස විධායක ජනාධිපති ධුරය ලංකාවට හඳුන්වා දෙන ලදි. පැවැති කැබිනට් ආණ්ඩු ක්‍රමය ජනාධිපති ක්‍රමයකට පරිවර්තනය කිරීමේ වෙනස ආරම්භ කළේ ඒ අන්දමට ය.

1947 ව්‍යවස්ථාව යටතේ නාමික විධායකය වූ 'අග්‍රාණ්ඩුකාරයා'ට එරෙහිව නඩු පැවරිය නොහැකි විය. හේතුව අග්‍රාණ්ඩුකාරයා එංගලන්තයේ රැජිනගේ නියෝජිතයා වීම සහ එංගලන්තයේ රැජින වැරදි නොකරන බවට වන පූර්ව නිගමන මූලධර්මයයි. ඒ නාමික තනතුරකට වගකීම් පැවරීමක් සිදු



ශ්‍රීලාල් සෙනෙවිරත්න

නොකරන පදනම මතය. එය 1972 ව්‍යවස්ථාව ද ඉදිරියට ගෙන ගියේය. ඒ එදා ජනාධිපති නාමික විධායක වූ බැවිනි. 1977 මේ සංශෝධනයේ දී ජනාධිපති දේශපාලන විධායකය බවට පත් කෙරුණ ද එම වගන්තිය ඉවත් නොකෙරිණ. මෙසේ දේශපාලන නායකයකු වන ජනාධිපතිවරයා නීතියට ඉහළින් තබන ලදි.
මෙලෙස නිර්මාණය කරන ලද ජනාධිපති තනතුරේ බලය ශක්තිමත් කිරීම ඉලක්ක කර ගෙන 78 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කරන ලදි. මැතිවරණ ක්‍රමය ආදී සියලු දේ සකස් කරන ලද්දේ ජනාධිපති ධුරය ශක්තිමත් කිරීමට අවශ්‍ය වන ආකාරයටය. ජනාධිපති ධුරයේ බලය දුර්වල කළ හැකි සියලු දේම ඉවත් කරන ලදි. පැනවුණු එකම සීමාව වූයේ එක් පුද්ගලයෙකුට විධායක ජනාධිපති ධුරයට දෙවරකට වඩා පත්විය නොහැකි බවට වන සීමාවය. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා 18 වන ව්‍යවස්ථා සංශෝධනය ගෙන එමින් පසුව ඒ එකම සීමාව ද ඉවත් කර දැමීය.
එහෙත් ජනාධිපති ධුරයට පැවරුණු බලය විශාලය. ජනාධිපති රාජ්‍යයේ නායකයා. විධායකයේ නායකයා. ආණ්ඩුවේ නායකයා සහ සේනාධිනායකයා ද විය. රාජ්‍යයේ නායකයා වන විට කිසිදු භේදයකින් තොරව සියලු ජනතාවගේ නායකයා විය යුතුය. එහෙත් විධායකයේ නායකයා වූ විට තත්ත්වය ඊට ප්‍රතිවිරුද්ධ විය. ඇමැතිවරුන් පත් කරනු ලබන්නේ ද ජනාධිපති විසින්ය. ඔවුනට පැවරෙන්නේ ජනාධිපති පවරන විධායක බලතලය. ජනාධිපති පත්කරන ඇමැතිවරුන් අමාත්‍ය මණ්ඩලය ලෙස ආණ්ඩුව වේ. ඒ ආණ්ඩුවේ නායකයා ජනාධිපතිය. එම නිසා ඇමැති මණ්ඩල රැස්වීම්වල මූලාසනය ගන්නේ ජනාධිපතිය. ජනාධිපතිවරයාට හිතුමතයේ ඇමැතිවරුන් පත් කිරීමට හැකියාව ව්‍යවස්ථාවෙන් ලැබිණ. ඇමැතිවරුන් පමණක් නොව අගමැතිවරයකුද හිතුමතයේ පත් කිරීමේ බලය ජනාධිපතිට හිමි විය. ව්‍යවස්ථාවේ අගමැතිවරයකු පත් කිරීම පිළිබඳ සඳහන් වන්නේ ''පාර්ලිමේන්තුවේ බහුතර මන්ත්‍රීවරුන් පිරිසකගේ විශ්වාසය ඇතැයි ජනාධිපතිවරයාට හැඟෙන මන්ත්‍රීවරයා'' අගමැතිවරයා වශයෙන් පත් කිරීමට ජනාධිපතිට බලය ඇති බවය. ජනාධිපතිට ''හැඟෙන'' මන්ත්‍රීරයා මිස සැබෑ ලෙසම බහුතරයේ විශ්වාසය හිමි මන්ත්‍රීවරයා පත්කළ යුතු වන්නේ නැත. වර්තමානයේ තමන්ට අවශ්‍ය පුද්ගලයා පමණක් නොව බලය සඳහා වන හවුල ආරක්ෂා කරගැනීමට අවශ්‍යවන මන්ත්‍රීවරයා අගමැති ධුරයට පත් කිරීමට ජනාධිපතිවරයාට හැකියාව ලැබී ඇත්තේද එමගිනි.
ජනාධිපති ධුරය ක්‍රියාත්මක වූ ආකාරය හේතුවෙන් විධායක ජනාධිපති ධුරය ඉවත් කළ යුතු බවට විශාල රැල්ලක් මතුවුණේ 1994 දීය. භීෂණය, දූෂණය හා මර්ධනය ජනාධිපති ධූරය සමඟ සම්බන්ධ බව ජනතාවට පෙනී ගොස් තිබීම ඊට හේතු විය. එබැවින් විධායක ජනාධිපති ධුරය ඉවත් කරන බවට වන සටන් පාඨය සමඟ මැතිවරණයට පැමිණි චන්ද්‍රිකා බණ්ඩාරනායක ජයග්‍රහණය කළේය. පසුගිය ජනාධිපතිවරණයේ දී, යුද්ධය දිනූ නායකයා ලෙස මහා බලයක් සමඟ පැමිණි මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාව පරාජය කළේද විධායක ජනාධිපති ධුරය අහෝසි කරන බවට වන ප්‍රබල සටන් පාඨය මගිනි. මුළු රටේම ඡන්ද භේදයකින් තොරව ඡන්ද ලැබුණේ ජනාධිපති ධුරය නුසුදුසු බවට වන අදහස මිනිසුන්ගේ මනසේ පැලපදියම්ව ඇති බැවිණි.

ඊට හේතුව ජනාධිපති ධුරය ක්‍රියාත්මක වූ අකාරයයි. ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයාට මන්ත්‍රී මණ්ඩලය පාලනය කළ හැකිය. ඇමැති මණ්ඩලය පාලනය කළ හැකිය. උසාවිය ද පාලනය කළ හැකිය. ජනාධිපති මහින්ද රාජපක්ෂ තමන්ට අවශ්‍ය නැති අගවිනිසුරු දින කිහිපයක් තුළ එළියට දැමූ හැටි අපි දුටුවෙමු. අග්‍රවිනිශ්චයකාර ධුරයද ඉතාමත් බලවත් ධුරයකි. ඊට ඉහළින් කිසිවෙකුට යා නොහැකි ආකාරයෙන් ස්ථාපිත

16 වන පිටට